කුඩා තේ හා රබර් වතු පුනර්ජීවන ව්‍යාපෘතිය - 2020

කුඩා තේ හා රබර් වතු පුනර්ජීවන ව්‍යාපෘතියේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජය හා කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන අන්තර් ජාතික අරමුදල අතර 2016 අප්‍රේල් 26 දින එළඹි අංක 2000001447 දරන ණය අරමුදල් ගිවිසුමේ IX ව්‍යවස්ථාවේ 9.03 (අ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළයුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය

ණය අරමුදල් ගිවිසුම අනුව, වැවිලි අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ප්‍රදේශය තුළ කුඩා තේ හා රබර් වතු හිමියන්ගේ ඵලදායී, ලාභදායී හා නම්‍යශීලී ආර්ථික කටයුතු තවත් වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ණය අරමුදල් ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 8,502.08 කට සමාන වූ එජඩො මිලියන 65.40 වන අතර ඉන් රු. මිලියන 3,349.28 කට සමාන වූ එජඩො මිලියන 25.77 ක් සැපයීම සඳහා කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන අන්තර් ජාතික අරමුදල සමඟ එකඟ වී තිබුණි. ඉතිරි මුදල රු. මිලියන 5,152.80 ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යනය කිරීමට බලාපොරොත්තු වේ. ව්‍යාපෘතියේ කටයුතු 2016 අගෝස්තු 15 දින ආරම්භ කරන ලද අතර, 2021 අප්‍රේල් 23 දින වනවිට නිම කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේවෙතත්, ව්‍යාපෘතිය අවසන් කරන දිනය 2022 ජූනි 30 දින දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 මතය

2020 දෙසැම්බර් 31 දිනට කුඩා තේ හා රබර් වතු පුනර්ජීවන ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා එහි මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. භෞතික කාර්යසාධනය

## 2.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික ප්‍රගතිය

| සංරචකය | ක්‍රියාකාරකම | 2020 දෙසැම්බර් 31 දිනට | | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | ප්‍රමාදයට හේතු | විගණකගේ නිර්දේශයන් |
|---|---|---|---|---|---|---|---|
| | | අපේක්ෂිත භෞතික කාර්ය සාධනය | ළඟා කරගෙන ඇති කාර්ය සාධනය | | | | |
| | | ඒකක | ඒකක | | | | |
| කුඩා තේ වතු හිමියන්ගේ සංවර්ධනය | කුඩා තේ වතු හිමියන් සඳහා වෙළඳපල මත පදනම් වූ නිෂ්පාදන සහාය | හෙක්.650 | හෙක්.205 | 2016 සිට 2022 දක්වා තෝරාගත් දිස්ත්‍රික්ක 06 ක තේ ඉඩම් හෙක්ටයාර 5500 ක් ප්‍රතිසංස්කරණය කර නැවත වගා කිරීමට ව්‍යාපෘතිය සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත්, සැලසුම් කළ පරිදි 2016 වසරේ ව්‍යාපෘතිය එහි මෙහෙයුම් ආරම්භ කර නොතිබුණි. එබැවින් 2020 දෙසැම්බර් 31 වන විට පුනරුත්ථාපනය කර නැවත වගා කර ඇත්තේ හෙක්ටයාර් 2,102 ක් පමණි. ඒ අනුව තේ ඉඩම් ප්‍රතිසංස්කරණය කර නැවත වගා කිරීමේ ඉලක්කය හෙක්ටයාර් 4,500 ක් දක්වා සංශෝධනය කිරීමට ව්‍යාපෘතිය තීරණය කර තිබුණි. එබැවින් වසරකට තේ ඉඩම් හෙක්ටයාර 650 ක් වත් | තේ නැවත වගා කිරීමේ ප්‍රධාන කන්නය යල කන්නය වන බැවින්, 2020 මාර්තු 16 වැනිදා සිට කොවිඩ් 19 වසංගතය ආරම්භ වීමත් සමඟ රට අගුලු දමා තිබුණි. | Covid -19 වසංගතය හේතුවෙන් තාක්ෂණික ව්‍යාප්ති සේවා ලබාගැනීමේ දුෂ්කරතා | සැලැස්මේ ක්‍රියාකාරකම් නියමිත පරිදි සිදු කළ යුතුය. |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | පුනරුත්ථාපනය කළ යුතු අතර ව්‍යාපෘතිය ආරම්භ කර වසර 5ක් ඇතුළත මුළු තේ ඉඩම්වලින් සියයට 75 ක් ප්‍රතිසංස්කරණය කර නැවත වගා කළ යුතුව තිබුණද එය සාක්ෂාත් කර ගෙන තිබුණේ සියයට 46 ක් පමණි. | | | |
| කුඩා රබර් වතු හිමියන්ගේ සංවර්ධනය | වෙළෙඳපොළ මත පදනම් වූ නිෂ්පාදනය සහ සැකසීම | හෙක්. 3,000 | හෙක්. 2,623 | මොණරාගල සහ අම්පාර දිස්ත්‍රික්ක දෙකෙහි නව රබර් වගා ඉලක්කය ව්‍යාපෘති කාලය තුළ හෙක්ටයාර් 3,000 ක් වූ අතර 2016 වසරේ සිට 2019 දක්වා හෙක්ටයාර 2,094 ක් වගා කර තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ ඉතිරි හෙක්ටයාර 906 ක් වගා කිරීමට සැලසුම් කර තිබුණද, හෙක්ටයාර 529 ක් පමණක් වගා කර තිබූ බැවින් රබර් වගාවේ අපේක්ෂිත ඉලක්කය සපුරා ගැනීමට නොහැකි වී තිබුණි. | 2019 අවසානයේ අධික වර්ෂාව නිසා රබර් මල් වල ශක්‍යතාව අඩු විය | අධික වර්ෂාව සහ බද්ධ කළ රබර් පැළ 2020 වසරේ රබර් තවාන්වලින් ලබාගත නොහැකි විය. | සියලුම ක්‍රියාකාරකම් නියමිත වේලාවට ක්‍රියාත්මක කළ යුතුය. |

**2.2 නිෂ්ක්‍රීය/ ඌන උපයෝජිත සම්පත්**

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | සමාලෝචිත වර්ෂයේ වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම අනුව පීඑච් මීටර, මෙතම් සෝඩියම් බෝතල් හා දැල් මිළදී ගැනීම සඳහා රු.මිලියන 18.7 ක් ප්‍රතිපාදනය කර තිබුණි. තේ පරීක්ෂක නිලධාරීන් සඳහා පීඑච් මීටර සහ තවාන් සඳහා දැල් මිළදී ගෙන නොතිබීමෙන් ප්‍රතිපාදනයෙන් රු.මිලියන 15.3 ක් හෙවත් සියයට 82 ක් ඌන උපයෝජනය වී තිබුණි | කොවිඩ් වසංගතය හේතුවෙන් කලට වේලාවට මිලදී ගැනීම් සිදුකිරීමට අපහසුවීම හේතුවෙන් එම කටයුතු සඳහා වෙන්කළ මුදලින් යොදවා ඇත්තේ සියයට 18 ක් පමණි. | සැලසුමේ ක්‍රියාකාරකම් සැලසුම් ව්‍යාපෘති කාල සීමාව තුළ නියමිත පරිදි ප්‍රමාදයකින් තොරව සිදු කළ යුතුය. |
| (ආ) | 2018 සිට 2019 දක්වා කාලය තුළ අම්පාර දිස්ත්‍රික්කයේ පදියතලාව රබර් තවානෙහි යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා ව්‍යාපෘතිය මඟින් රු. මිලියන 41.9 ක මුදලක් ලබා දී ඇති අතර, ඔවුන් විසින් රු. මිලියන 40.8 ක් භාවිතා කර ඇති අතර ඉතිරි රු. මිලියන 1.1 ක් බැංකු ගිණුමේ අක්‍රියව පැවතුණි. | 2019 දෙසැම්බර් 31 දිනට සංවර්ධන කටයුතු සඳහා ගෙවා ඇති මුළු වාරික ගෙවීම් රු. 41,938,445 කි. | අපේක්ෂිත ක්‍රියාකාරකම් ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් වේගවත් කර අධීක්ෂණය කළ යුතුය. |
| (ඇ) | ව්‍යාපෘතිය ආරම්භ කර වසර 5ක් ගතවී ඇතත් 2020 වර්ෂය සඳහා වෙබ් සැකසුම් කළමනාකරණ තොරතුරු පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා රුපියල් මිලියන 4.6 ක් වෙන් කර තිබුණි. කෙසේ වෙතත් එය ස්ථාපිත කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස දැනට පවතින දිස්ත්‍රික් කාර්යාලය සම්බන්ධීකරණය කිරීමට සහ අවශ්‍ය කළමනාකරණ තොරතුරු පද්ධතිය පවත්වාගෙන යාමට ව්‍යාපෘතියට නොහැකි වී තිබුණි. | ව්‍යාපෘතිය වෙබ් සැකසුම් කළමනාකරණ තොරතුරු පද්ධතියක් සංවර්ධනය කරමින් සිටින අතර මේ වන විට සියයට 80 ක භෞතික ප්‍රගතියක් වාර්තා කර ඇත. | කළමනාකරණ තොරතුරු පද්ධතියක් ස්ථාපිත කළ යුතුය. |
| (ඇ) | ව්‍යාපෘති ප්‍රතිඵල පිළිබඳ සමීක්ෂණයක් පැවැත්වීමට උපදේශනය සඳහා ලෙස 2020 වර්ෂයේදී රු.මිලියන 4.6 ක් වෙන් කර තිබුණද එය ක්‍රියාත්මක කර නොතිබුණි. | ව්‍යාපෘති ප්‍රතිඵල සමීක්ෂණ ප්‍රසම්පාදන කටයුතු 2020 මුල් භාගයේදී ආරම්භ වුවද, එය අවසන් වූ පසු සමීක්ෂණය සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පශ්චාත් කෘෂිකර්ම ආයතනය තෝරා ගත් අතර කොවිඩ් 19 වසංගතයේ දෙවන රැල්ල හේතුවෙන් ප්‍රතිලාභීන් වෙත ළඟා වීමේ දුෂ්කරතා ඇති විය. | ව්‍යාපෘති ප්‍රතිඵල ඇගයීම සඳහා ව්‍යාපෘති ප්‍රතිඵල සමීක්ෂණ ක්‍රියාත්මක කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | සමාලෝචිත වර්ෂය තුළ පාරිසරික හා සමාජ ආරක්ෂණ උපදේශන කටයුතු සඳහා රු.මිලියන 1.8 ක් වෙන් කර තිබුණද, උපදේශකයකු නොමැතිකම හේතුවෙන් රු.900,000 ක් හෙවත් සියයට 50 ක් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. | 2019 දෙසැම්බර් 31 වැනි දින ප්‍රසම්පාදන කමිටුව විසින් උපදේශකයකු පත් කිරීම අනුමත කර ඇති අතර අදාළ උපදේශකවරයා 2020 පෙබරවාරි 1 සිට ජූලි 31 දක්වා කෙටි කාලීන උපදේශන සේවාවක් සපයා ඇත. | උපදේශකයෙකු පත් කළ යුතුය. |